# රාවණා පුවත යථාවක් ද? මිථ්‍යාවක් ද?

**කවුඩාගම්මන රතනසාර හිමි**

**පේරාදෙණිය විශ්ව විද්‍යාලය**

**0717972328**

kaudagammanarathana@gmail.com

ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳ කරුණු අධ්‍යයනයෙහි නියුක්ත වූවෝ බොහොමයක් "විජයාවතරණයෙන් ශ්‍රී ලංකාවේ ඉතිහාසය ඇරඹේය" යන මතයට විරෝධත්වය දක්වති. ඔවුන්ගේ අදහස ඊට බොහෝ කලකට පෙර ලංකාව ජනාවාසව පැවති බවයි. උගතුන් බොහොමයක් එම මතවාදය දැරුව ද විජයාවතරණයට පෙර ශ්‍රී ලංකාවේ තත්ත්වය කෙබඳු වීදැයි සිදු කරන ලබන අධ්‍යයනයන් හෝ පර්යේෂණයන් ප්‍රාමාණික වන බවක් නොපෙනේ.විජයාවතරණයට පෙර ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳ කරුණු හැදෑරීමේ දී රාවණ පුවතට හිමිවන්නේ වෛශේෂික ස්ථානයකි. කලක පටන් ශ්‍රී ලංකාව තුළ රාවණ පුවත සම්බන්ධයෙන් උද්‍යෝගයක් ඇති වෙමින් පවතී.

බොහෝ දෙනෙක් රාවණ පුවත හුදු ජනප්‍රවාදයකැයි ප්‍රතික්ෂේප කරති. ලංකා ඉතිහාසය පිළිබඳව ලියැවී ඇති කෘතිවල රාවණ පුවත ඓතිහාසික සංසිද්ධියක් ලෙස අන්තර්ගත නොකිරීම ද ඊට හේතුවක් වී තිබේ. එහෙත් ඉන්දියාවේ සිටි බ්‍රිතාන්‍ය ජාතික ඉතිහාසඥයන් ඇතුළු වියතුන් රාවණ පුවත හා සබැඳි රාම රජුගේ ඓතිහාසිකත්වය පිළිගනු ලබයි. වාර්ෂිකව සිදු කරන 'දුසේරා' නම් උත්සවයකින් රාවණගේ පඹයකු පුළුස්සමින් ඔවුන් එම සිදුවීම සිහිපත් කරයි. ලංකාවේ වර්තමාන පොදු සමාජය තුළරාවණ පුවත පිළිබඳව යම් උද්‍යෝගයක් පවතී. මෙය හුදු ප්‍රවාදයකැයි බැහැර කිරීමට වඩා උචිත වන්නේ ඒ පිළිබඳ විධිමත් අධ්‍යයනයන් සිදු කිරීමයි. මේ පිළිබඳ විධිමත් පර්යේෂණයන් පවත්වා කරුණු හෙළිදරව්කිරීම වියතුන්ගේ යුතුකමක් හා වගකීමක් ව පවතී.මේ වන විටත් ඒ පිළිබඳ වියතුන් සුළු පිරිසකගේ අවධානය යොමුව තිබේ. රාවණ රජු සහ ඔහුගේ පරම්පරාව අභිලේඛනයන් උපයුක්ත කොටගෙන හඳුනාගත හැකිව තිබේ. පියා විශ්‍රවස් මුනි, සීයා පුලස්ති මහාඍෂි ලෙස ද ඉන්ද්‍රජිත් පුත්‍රයා ලෙසත්, අශිය මුණුපුරා ලෙසත් තිමිර සහ තේඝඩශමී මුණුපුරන් ලෙසත් පරම්පරා 12ක් පමණ හඳුනාගත හැකිව තිබේ. එසේ ම ජනප්‍රවාද හා බැඳුණු සිදුවීම් වූ ස්ථානයන් තුළ යම් යම් අවශේෂ සාධක ලෙස දැකිය හැකිවීම රාවණ පුවතේ ඓතිහාසිකත්වය විමංසනයට අපව වඩාත් යොමු කරවයි. දිවයිනේ සබරගමුව මධ්‍යම යන පළාත්වල බොහෝ ස්ථාන නාමයන් රාම රාවණ පුවතට සම්බන්ධ නාමයන්ය. අංශුමාත්‍ර හෝ සත්‍යයකින් තොරව එවැනි ජනප්‍රවාද ගොඩනැගිය හැකිද?විලියම් ජෝන්ස්, සෙනරත් පරණවිතාන,මිරැන්ඩෝ ඔබේසේකර, සූරිය ගුණසේකර ආදීන් රාවණ සම්බන්ධව විවිධ මතවාද ඉදිරිපත් කර තිබේ. මෙතෙක්රාවණ පුවත සම්බන්ධව සිදු කෙරුණු පර්යේෂණයන් සහ මහාභාරතය රාමායණය ආදී කෘතීන් ද පරිශීලනය කරමින් හා ජනප්‍රවාදයන් ද උපයුක්ත කරගනිමින් රාවණ පුවත ඓතිහාසික සංසිද්ධියක් ද නැතහොත් හුදු ප්‍රවාදයක් පමණක් ද යන්න විමංසනයට ලක්කිරීම අත්‍යවශ්‍ය වේ.

ප්‍රමුඛ පද :රාවණා රජු, ජනප්‍රවාද, රාවණ පිළිබඳ පවතින සාධක, විද්වත් මත, සත්‍යාසත්‍යතාව